# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## විශේෂ භාණ්ඩ හා සේවා බදු

**බද්දක්, තීරු බද්දක්, අය බද්දක්, සෙස් බද්දක් හෝ නීතිය මගින් පනවනු ලබන වෙනත් යම් ගාස්තුවක් වශයෙන් යම් නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ හා සේවා මත අය කළ හැකි මුදල වෙනුවට විශේෂ භාණ්ඩ හා සේවා බද්දක් පැනවීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද; නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ හා සේවා මත විවිධ බදු ක්‍රම අදාළ වීම සහ පරිපාලනය, ආශ්‍රිත සංකීර්ණත්වයන් වැළැක්වීමෙන් එකී බදු එකතු කිරීම සහ පරිපාලනය සම්බන්ධව වැඩි කාර්යක්ෂමතාවක් සහතික කිරීම පිණිස බදු ගෙවීමේ දී ස්වයං අනුකූලතාව වැඩි දියුණු කිරීම සඳහා ද; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි**

මුදල් අමාත්‍යතුමා විසින් 2022 ජනවාරි මස 20 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2022 ජනවාරි මස 07 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[101 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිල : රු. 48.00** **තැපැල් ගාස්තුව : රු. 35.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

එල්. ඩී.— ඕ. 20/2021

**බද්දක්, තීරු බද්දක්, අය බද්දක්, සෙස් බද්දක් හෝ නීතිය මගින් පනවනු ලබන වෙනත් යම් ගාස්තුවක් වශයෙන් යම් නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ හා සේවා මත අය කළ හැකි මුදල වෙනුවට විශේෂ භාණ්ඩ හා සේවා බද්දක් පැනවීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද; නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ හා සේවා මත විවිධ බදු ක්‍රම අදාළ වීම සහ පරිපාලනය, ආශ්‍රිත සංකීර්ණත්වයන් වැළැක්වීමෙන් එකී බදු එකතු කිරීම සහ පරිපාලනය සම්බන්ධව වැඩි කාර්යක්ෂමතාවක් සහතික කිරීම පිණිස බදු ගෙවීමේ දී ස්වයං අනුකූලතාව වැඩි දියුණු කිරීම සඳහා ද; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

1. මේ පනත 2022 අංක      දරන විශේෂ භාණ්ඩ හා සේවා බදු පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

විශේෂ භාණ්ඩ හා සේවා බද්දක් පැනවීම

**2.** (1) මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් ප්‍රඥප්තියක් ප්‍රකාර, පනවන ලද බද්දකට, තීරු බද්දකට, අය බද්දකට, සෙස් බද්දකට හෝ වෙනත් යම් ගාස්තුවකට යටත් වන පහත සඳහන් නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ හා සේවා මත එනම්:-

(අ) නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ වන මත්පැන්, සිගරට්, සහ වාහන (වාහන එකලස් කිරීම සඳහා වන කොටස් ඇතුළු) මත; සහ

(ආ) නිශ්චිතව දක්වා ඇති සේවා වන විදුලි සංදේශ, සහ ඔට්ටු ඇල්ලීම සහ සූදු මත,

ගෙවිය යුතු සංයුක්ත බද්දක් වන විශේෂ භාණ්ඩ හා සේවා බද්ද යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු බද්දක් පනවනු ලැබිය යුතු ය.

(2) විශේෂ භාණ්ඩ හා සේවා බද්ද, (1) වන උපවගන්තියේ සඳහන් නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ හා සේවා සඳහා සීමා විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින්, කලින් කලට, ගැසට් පත්‍රයේ පළකරන ලද නියමයක් මගින්-

(අ) එම නියමය අදාළ වන නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ හෝ සේවාවන් හි වටිනාකම මත හෝ විශේෂත්වය මත අදාළ බදු අනුප්‍රමාණ නිශ්චිතව දැක්විය යුතු ය; හෝ

(ආ) නියමය අදාළ වන නිශ්චිතව දක්වා ඇති භාණ්ඩය හෝ සේවාව සම්බන්ධයෙන් විශේෂ භාණ්ඩ හා සේවා බද්ද ගණනය කිරීමේ පදනම නිශ්චිතව දැක්විය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියමයක් ම, අමාත්‍යවරයා විසින් එම නියමය ප්‍රත්‍යාදිෂ්ට කරනු ලබන තෙක් හෝ (3) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් එවැනිම නියමයක් පසුව සාදනු ලබන තෙක් බලාත්මකව පැවතිය යුතු ය.

(5) (3) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද එවැනි සෑම නියමයක් ම, අමාත්‍යවරයා විසින් එහි ඔහුගේ අත්සන තැබූ පසු වහාම ක්‍රියාත්මක විය යුතු ය.

(6) එවැනි සෑම නියමයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

(7) සෑම නියමයක් ම, එය ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ දින සිට මාස තුනක කාලසීමාවක් ඇතුළත පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා ඉදිරිපත් කළ යුතු ය. එම කාලසීමාව ඇතුළත පාර්ලිමේන්තු රැස්වීමක් නොපවත්වන අවස්ථාවක, එම කාලසීමාව ඉකුත්වීමෙන් පසුව පවත්වනු ලබන පළමු පාර්ලිමේන්තු රැස්වීමේ දී එම නියමය අනුමත කරගැනීම සඳහා පාර්ලිමේන්තුව වෙත මෝසමක් මගින් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(8) පාර්ලිමේන්තුව විසින් අනුමත කිරීම ප්‍රතික්ෂේප කරන එවැනි යම් නියමයක්, එම නියමය, එම යෝජනා සම්මතයේ දින සිට බලාත්මක වන පරිදි ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත්, ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් අගතියක් නොවිය යුතු ය.

ඇතැම් භාණ්ඩ හා සේවාවන් නිදහස් කිරීම

3. (1) (අ) 2 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අමාත්‍යවරයා විසින්, කලින් කලට ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, එම නියමයේ නිශ්චිතව දැක්විය හැකි පරිදි යම් කොන්දේසිවලට යටත්ව, එම නියමයේ නිශ්චිතව දක්වා ඇති යම් භාණ්ඩ හෝ සේවාවක් හෝ යම් භාණ්ඩ හා සේවාවක එවැනි යම් පංතියක්, වර්ගයක්, ඛාණ්ඩයක් හෝ විස්තරයක් මෙම පනත යටතේ ගෙවිය යුතු විශේෂ භාණ්ඩ හා සේවා බද්දෙන් නිදහස් කළ හැකි ය.

(ආ) සැක දුරුකරගැනීම සඳහා, මෙහි උපලේඛනයේ දක්වා ඇති ප්‍රඥප්තිවල විධිවිධාන (අ) ඡේදයේ යටතේ සාදන ලද නියමයේ නිශ්චිතව දක්වා ඇති එම භාණ්ඩ හා සේවා සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

(2) යම් නිෂ්පාදකවරයකු හෝ ආනයනකරුවකු යම් භාණ්ඩයක් (1) වන උපවගන්තිය යටතේ සාදන ලද නියමයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට පටහැනිව විකුණන හෝ බැහැර කරන අවස්ථාවක, එම නිෂ්පාදකවරයා හෝ ආනයනකරු, එම භාණ්ඩය සඳහා මෙම පනත යටතේ ගෙවිය යුතු වන විශේෂ භාණ්ඩ හා සේවා බද්ද, එම විශේෂ භාණ්ඩ හා සේවා බද්දට යටත්වන ආකාරයෙන් ම ගෙවීමට යටත් විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියමයක් ම, අමාත්‍යවරයා විසින් එම නියමය ප්‍රත්‍යාදිෂ්ට කරනු ලබන තෙක් අඛණ්ඩව බලාත්මකව පැවතිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද එවැනි සෑම නියමයක් ම, අමාත්‍යවරයා විසින් එහි ඔහුගේ අත්සන තැබූ පසු වහාම ක්‍රියාත්මක විය යුතු ය.

(5) එවැනි සෑම නියමයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

(6) සෑම නියමයක් ම, එය ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ දින සිට මාස තුනක කාලසීමාවක් ඇතුළත පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා ඉදිරිපත් කළ යුතු ය. එම කාලසීමාව ඇතුළත පාර්ලිමේන්තු රැස්වීමක් නොපවත්වන අවස්ථාවක, එම කාලසීමාව ඉකුත්වීමෙන් පසුව පවත්වනු ලබන පළමු පාර්ලිමේන්තු රැස්වීමේ දී එම නියමය

අනුමත කරගැනීම සඳහා පාර්ලිමේන්තුව වෙත මෝසමක් මගින් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(7) පාර්ලිමේන්තුව විසින් අනුමත කිරීම ප්‍රතික්ෂේප කරන එවැනි යම් නියමයක්, එම නියමය, එම යෝජනා සම්මතයේ දින සිට බලාත්මක වන පරිදි ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත්, ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් අගතියක් නොවිය යුතු ය.

විශේෂ භාණ්ඩ හා සේවා බද්ද පනවා නියම කරනු ලැබීමෙන් පසුව, මෙහි උපලේඛනයේ දක්වා ඇති ප්‍රඥප්ති යටතේ කිසිදු බද්දක් අයකිරීම අදාළ නොවිය යුතු ය

**4.** 2 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයක් ක්‍රියාත්මක වන අවස්ථාවක, මෙහි උපලේඛනයේ දක්වා ඇති යම් ප්‍රඥප්තියක් ප්‍රකාරව පනවන ලද කිසිදු බද්දක්, තීරු බද්දක්, අය බද්දක්, සෙස් බද්දක් හෝ වෙනත් යම් අය කිරීමක්, එම නියමය ක්‍රියාත්මක වන දින සිට සහ ඉන් පසුව, මෙම පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් යම් නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු යː

එසේ වුව ද, අවශ්‍ය අවස්ථාවක, මේ පනතේ විධිවිධාන හෝ එය යටතේ සාදන ලද නියෝගවල විධිවිධාන බලාත්මක කිරීම, විධිවිධාන උල්ලංඝනය කිරීම වැළැක්වීම සහ ඒ සඳහා දඬුවම් කිරීමේ කාර්ය සඳහා මෙහි උපලේඛනයේ දක්වා ඇති ප්‍රඥප්තිවල විධිවිධාන අදාළ විය යුතු ය.

විශේෂ භාණ්ඩ හා සේවා බද්ද පරිපාලනය කිරීම සහ එකතු කිරීම භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වෙත පැවරිය යුතු බව

**5.** (1) (අ) භාණ්ඩාගාර ලේකම් විසින්, භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයකුගේ (මෙහි මින්මතු "නම් කරන ලද නිලධරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) අධීක්ෂණය යටතේ අංශයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(ආ) මේ පනත ප්‍රකාර පනවන ලද සහ 9 වන වගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි ගෙවන ලද විශේෂ භාණ්ඩ හා සේවා බද්ද පරිපාලනය කිරීම, එකතු කිරීම සහ ඒ සම්බන්ධයෙන් වන වගවීම නම් කරන ලද නිලධරයා වෙත පැවරිය යුතු ය.

(2) භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින්, අවශ්‍ය විය හැකි පරිදි වූ මුදල් අමාත්‍යාංශයට අනුයුක්ත හෝ මුදල් අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ඇති යම් දෙපාර්තමේන්තුවකට අනුයුක්ත යම් නිලධරයන් සංඛ්‍යාවක් එම අංශයට පත් කරනු ලැබිය යුතු ය.

(3) නම් කරන ලද නිලධරයා විසින්, මේ පනත යටතේ ඔහු වෙත පිරිනැමුණු හෝ පැනවූ හෝ පැවරුණු යම් බලතල, කාර්යය හෝ කර්තව්‍ය, (2) වන උපවගන්තිය ප්‍රකාර පත් කරන ලද යම් නිලධරයකු වෙත පවරනු ලැබිය හැකි ය.

(4) එම බලතල, කාර්යය හෝ කර්තව්‍ය පවරනු ලැබුවේ යම් නිලධරයකු වෙත ද එකී නිලධරයා විසින්, නම් කරන ලද නිලධරයා විසින් කලින් කලට නිකුත් කරනු ලබන සාමාන්‍ය හා විශේෂ විධානයන්ට යටත්ව එකී බලතල, කාර්යය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හෝ කිරීම කළ යුතු ය.

විශේෂ භාණ්ඩ හා සේවා බද්ද ගෙවීමට යටත් වීම

**6.** (2) වගන්තියේ (1) වන උපවගන්තියේ දක්වා ඇති යම් නිශ්චිතව දක්වා ඇති භාණ්ඩයක සෑම නිෂ්පාදකවරයකුම හෝ අපනයනකරුවකු ම හෝ යම් සේවාවක් සපයන්නකුම විසින්, (මෙහි මින්මතු “බදු අය කළ හැකි තැනැත්තා” යනුවෙන් සඳහන් කරනු ලබන) විශේෂ භාණ්ඩ හා සේවා බද්ද ගෙවිය යුතු ය.

බදු අයකළ හැකි තැනැත්තකු ලියාපදිංචි කිරීම සහ ලියාපදිංචිය අවලංගු කිරීම

**7.** (1) (අ) 2 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ සාදන ලද නියමයක් ක්‍රියාත්මක වන දිනයේ දී යම් නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ හෝ ආනයනය කිරීමේ හෝ යම් නිශ්චිතව දක්වා ඇති සේවාවක් සැපයීමේ නිරත වන යම් බදු අය කළ හැකි තැනැත්තකු විසින්, එම නියමය ක්‍රියාත්මක වන දින සිට දින දාහතරක් ගතවීමට පෙර නම් කරන ලද නිලධරයා වෙත බදු අය කළ හැකි තැනැත්තකු ලෙස ලියාපදිංචි වීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(ආ) මේ පනතේ 2 වන වගන්තියේ (3) වන උපවගන්තිය ප්‍රකාර සාදන ලද නියමයක් ක්‍රියාත්මක වන දිනයට පසු යම් නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ නිෂ්පාදනය කිරීමට හෝ ආනයනය කිරීමට හෝ යම් නිශ්චිතව දක්වා ඇති සේවාවක් සැපයීමට අපේක්ෂා කරන තැනැත්තකු විසින්, එකී නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ නිෂ්පාදනය කිරීමට හෝ ආනයනය කිරීමට හෝ එකී නිශ්චිතව දක්වා ඇති සේවාව සැපයීමට පෙරාතුව, නියමිත ගාස්තුව සහ ලේඛන සමඟ නියමිත ආකෘතියෙන් වන ඉල්ලීමක් නම් කරන ලද නිලධරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(ඇ) ලියාපදිංචි කිරීම සඳහා අනුගමනය කළ යුතු කාර්යය පටිපාටිය නියෝග මගින් නියම කරනු ලබන පරිදි විය යුතු ය.

(ඇ) ලියාපදිංචි කිරීම සඳහා වන එකී ඉල්ලීම ලැබීමෙන් පසු, නම් කරන ලද නිලධරයා විසින්, වහාම (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, එම තැනැත්තාව බදු අය කළ හැකි තැනැත්තකු ලෙස ලියාපදිංචි කිරීම කර ගෙන යා යුතු ය.

(2) නම් කරන ලද නිලධරයා විසින්, යම් තැනැත්තකු බදු අය කළ හැකි තැනැත්තකු ලෙස ලියාපදිංචි කිරීමට පෙරාතුව, අවශ්‍ය අවස්ථාවක, බදු අය කළ හැකි තැනැත්තා විසින් ඉදිරිපත් කර ඇති ලේඛනවලට සාක්ෂි වශයෙන් වැඩිදුර තොරතුරු හෝ ලේඛන ඉල්ලා සිටිය හැකි අතර එකී බදු අය කළ හැකි තැනැත්තා විසින්, නම් කරන ලද නිලධරයා විසින් නිශ්චිතව දක්වන ලද කාලසීමාව ඇතුළත එම තොරතුරු සහ ලේඛන ලබාදිය යුතු ය.

(3) ඉදිරිපත් කරන ලද තොරතුරුවල හෝ ලේඛනවල අව්‍යාජ බව පිළිබඳ සාධාරණ සැකයක් පවතී නම්, නම් කරන ලද නිලධරයා විසින් එම තැනැත්තාව බදු අය කළ හැකි තැනැත්තකු ලෙස ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි අතර එම තීරණය සිදු කරන ලද දිනයෙන් දින දාහතරක් ඇතුළත නම් කරන ලද නිලධරයා විසින්, එය ප්‍රතික්ෂේප කිරීම සඳහා වන හේතු සඳහන් කරමින් ලිඛිත දැන්වීමක් එම තැනැත්තා වෙත භාරදිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ වන ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ දැන්වීම ලැබීමෙන් පසු බදු අය කළ හැකි තැනැත්තා විසින්, ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම ලැබී දින දාහතරක් ඇතුළත සිය ඉල්ලීම සනාථ කිරීම සඳහා වැඩිදුර හේතු සහ ලේඛන දක්වමින් භාණ්ඩාගාර ලේකම් වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(5) භාණ්ඩාගාර ලේකම් විසින්, (4) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලීමේ දක්වා ඇති හේතු සහ ඉදිරිපත් කරන ලද ලේඛන මත පදනම්ව ඉල්ලීම සලකා බලා, බදු අය කළ හැකි තැනැත්තා ලියාපදිංචි කිරීම සඳහා සුදුසුකම් ලබන බව හෝ නොලබන බව නිශ්චය කර මේ පනතේ කාර්ය සඳහා එකී බදු අය කළ හැකි තැනැත්තාව ලියාපදිංචි කිරීම කරගෙන යා හැකි ය. භාණ්ඩාගාර ලේකම් විසින් සිය තීරණය පිළිබඳ, හැකි පහසු ඉක්මනින්, බදු අය කළ හැකි තැනැත්තා වෙත දැන්විය යුතු ය.

(6) ලියාපදිංචි කිරීමෙන් පසු, නම් කරන ලද නිලධරයා විසින් එකී බදු අය කළ හැකි තැනැත්තා වෙත නියෝග මගින් නියම කරනු ලබන පරිදි වූ ආකෘතියෙන් ලියාපදිංචි කිරීමේ සහතිකයක්

නිකුත් කරනු ලැබිය යුතු ය. ලියාපදිංචි කිරීමේ සහතිකයෙහි එම ලියාපදිංචි කිරීම මගින් ආවරණය කරන ලද නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ හෝ සේවා පිළිබඳ තොරතුරු සහ එම ලියාපදිංචි කිරීම වලංගු කාලසීමාව ඇතුළත් විය යුතු ය.

(7) නම් කරන ලද නිලධරයා විසින්, එසේ ලියාපදිංචි කරන ලද බදු අය කළ හැකි තැනැත්තන්ගේ නාමලේඛනයක් නියෝග මගින් නියම කරනු ලබන පරිදි වූ ආකෘතියෙන් පවත්වාගෙන යාමට ද කටයුතු කරනු ලැබිය යුතු ය.

(8) (අ) (i) බදු අය කළ හැකි තැනැත්තා විසින්, 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් යම් නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ ආනයනය කිරීම හෝ නිෂ්පාදනය කිරීම හෝ යම් නිශ්චිතව දක්වා ඇති සේවාවක් සැපයීම නතර කර ඇති අවස්ථාවක;

(ii) 2 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ සාදන ලද යම් නියමයක් අමාත්‍යවරයා විසින් ප්‍රත්‍යාදිෂ්ට කර ඇති අවස්ථාවක; හෝ

(iii) 2 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ සාදන ලද යම් නියමයක් 2 වන වගන්තියේ (8) වන උපවගන්ති යටතේ ප්‍රත්‍යාදිෂ්ට කර ඇති බවට සලකනු ලබන අවස්ථාවක,

නම් කරන ලද නිලධරයා විසින් හේතු දැක්වීමට අවස්ථාවක් ලබාදීමෙන් පසුව, ලියාපදිංචි කිරීම අවලංගු කිරීම සඳහා වන හේතු දක්වමින් ඔහු විසින් අත්සන් කරන ලද ලිඛිත ලියවිල්ලක් මගින් ඒ බව දැනුම් දීමෙන් පසු, (6) වන උපවගන්තිය යටතේ බදු අය කළ හැකි තැනැත්තා වෙත නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකය අවලංගු කරනු ලැබිය හැකි ය.

(ආ) බදු අය කළ හැකි තැනැත්තකු විසින්, ලියාපදිංචි කිරීම සිදු කරනු ලැබුවා වූ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් යම් නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ, ආනයනය කිරීම හෝ නිෂ්පාදනය කිරීම හෝ යම් නිශ්චිතව දක්වා ඇති සේවාවක් සැපයීම නතර කර ඇති අවස්ථාවක, (6) වන උපවගන්තිය යටතේ යම් ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කරනු ලැබුවේ එවැනි බදු අය කළ හැකි තැනැත්තකු වෙත ද, එම බදු අය කළ හැකි තැනැත්තා විසින්, එම

ලියාපදිංචි කිරීමේ සහතිකය අවලංගු කිරීම සඳහා ඉල්ලමින් නම් කරන ලද නිලධරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(9) 2 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ සාදන ලද නියමයක් ක්‍රියාත්මක වන දින සිට හෝ එදිනට පසු,-

(අ) ලියාපදිංචි කිරීමේ සහතිකයක් ලබාගැනීමෙන් තොරව මෙම පනත අදාළ වන යම් නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ ආනයනය කරන හෝ නිෂ්පාදනය කරන හෝ යම් නිශ්චිතව දක්වා ඇති සේවාවක් සපයන යම් බදු අය කළ හැකි තැනැත්තකු;

(ආ) යම් නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් වැදගත් තොරතුරක ව්‍යාජ හෝ නොමග යවනසුලු ප්‍රකාශයක් හෝ දැනුම් දීමක් මේ පනත යටතේ සිදු කරන යම් බදු අය කළ හැකි තැනැත්තකු; හෝ

(ඇ) විශේෂ භාණ්ඩ හා සේවා බද්ද ගෙවීම ඕනෑකමින් පැහැර හරින හෝ පැහැර හැරීමට උත්සාහ කරන යම් බදු අය කළ හැකි තැනැත්තකු, වරදක් සිදු කරනු ලබන අතර, ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් මිලියන තුනක් නොඉක්මවන දඩයකට හෝ වසරකට නොඅඩු දෙයාකාරයකින් එක් ආකාරයක කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම යටත් විය යුතු ය.

(10) සැක දුරුකිරීම සඳහා, අදාළ නීති ප්‍රකාර පනවන ලද සහ අදාළ වන බද්දක්, තීරු බද්දක්, අය බද්දක්, සෙස් බද්දක් හෝ වෙනත් යම් ගාස්තුවක්, මේ පනත යටතේ ආවරණය නොවන වෙනත් යම් භාණ්ඩ හා සේවා සම්බන්ධයෙන් අදාළ විය යුතු අවස්ථාවක, බදු අය කළ හැකි තැනැත්තකු විසින්, මේ පනත අදාළ නොවන යම් භාණ්ඩ ආනයනය කිරීම හෝ නිෂ්පාදනය කිරීම හෝ යම් සේවාවක් සැපයීම කළ හැකි ය.

**8.** (1) මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ බදු අය කළ හැකි සෑම තැනැත්තකු විසින් ම, එක් එක් කාර්තුව අවසන් වීමෙන් පසුව එළැඹෙන මාසයේ විසිවන දිනයේ හෝ ඊට පෙර- බදු අය කළ හැකි තැනැත්තකු විසින් වාර්තා සැපයීම

(අ) අදාළ කාලසීමාවට අදාළ භාණ්ඩ ලේඛනය පිළිබඳ භෞතික සත්‍යායනය තහවුරු කරමින් සුදුසුකම්ලත් විගණකවරයකු විසින් නිකුත් කරන ලද නියමිත ආකෘතියෙන් වන සහතිකයක්; සහ

(ආ) ආනයනය කරන ලද හෝ නිෂ්පාදනය කරන ලද නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ හෝ සපයන ලද නිශ්චිතව දක්වා ඇති සේවා හෝ මිලදී ගන්නා ලද අමුද්‍රව්‍යවලට අදාළ නියෝග මගින් නියම කරනු ලැබිය හැකි පරිදි වූ තොරතුරු ඇතුළත් ලේඛන,

සමඟ නියමිත ආකෘතියෙන් වන වාර්තාවක්, නම් කරන ලද නිලධරයා වෙත සපයනු ලැබිය යුතු ය.

(2) (අ) (1) වන උපවගන්තිය යටතේ වන වාර්තාවක්, තම පෞද්ගලික පරිහරණය සඳහා යම් නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ ආනයනය කරන ලද බදු අය කළ හැකි තැනැත්තකුගෙන් අවශ්‍ය නොවන්නේ ය.

(ආ) මේ උපවගන්තියේ කාර්යය සඳහා "පෞද්ගලික පරිහරණය" යන්නෙන්, මෙහි උපලේඛනයේ දක්වා ඇති යම් ප්‍රඥප්තියක් යටතේ ලාභයක් හෝ වාණිජමය ප්‍රතිලාභයක් සඳහා යොදාගත නොහැකි ප්‍රමාණයක් අදහස් වේ.

(3) (1) වන උපවගන්තිය යටතේ වාර්තාවක් ගොනු කිරීමට අපොහොසත් වන බදු අය කළ හැකි තැනැත්තකු වරදක් සිදු කරන අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියනයක් නොඉක්මවන දඩයකට හෝ මාස තුනක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමට හෝ එම දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම යටත් විය යුතු ය.

**9.** (1) 2 වන වගන්තිය යටතේ පනවන ලද විශේෂ භාණ්ඩ හා සේවා බද්ද සහ බදු අය කළ හැකි තැනැත්තකු විසින් ගෙවිය යුතු විශේෂ භාණ්ඩ හා සේවා බද්ද, අදාළ බදු අය කළ හැකි තැනැත්තා විශේෂ භාණ්ඩ හා සේවා බද්ද ගෙවිය යුතු ආකාරය

විසින් ඉලෙක්ට්‍රොනික මුදල් හුවමාරුවක් මාර්ගයෙන් මේ පනතේ කාර්ය සඳහා නම් කරන ලද නිලධරයාගේ නමින් විවෘත කර පවත්වාගෙන යනු ලබන ගිණුමක් වෙත සෘජුවම ගෙවනු ලැබිය යුතු අතර, එම ගෙවීම ඒකාබද්ධ අරමුදලට බැර විය යුතු බවට සලකනු ලැබිය යුතු ය.

(2) විශේෂ භාණ්ඩ හා සේවා බද්ද ගෙවීමට යටත් වන සෑම බදු අය කළ හැකි තැනැත්තකු විසින් ම, මෙහි පහත දක්වා ඇති අවස්ථාවක සහ ආකාරයෙන් එම ගෙවීම සිදු කරනු ලැබිය යුතු ය-

(අ) නිශ්චිතව දක්වා ඇති භාණ්ඩයක් ආනයනය කරනු ලබන බදු අය කළ හැකි තැනැත්තකු විසින් එකී නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ රේගු ගුදම්වලින් හෝ එම භාණ්ඩ ශ්‍රී ලංකාවට ආනයනය කිරීමෙන් ඉක්බිතිව ම ඒවා ගබඩා කර තිබෙන යම් ස්ථානවලින් ඉවත් කර ගැනීමට පෙර විශේෂ භාණ්ඩ හා සේවා බද්ද ගෙවීම සිදු කරනු ලැබිය යුතු යඃ

එසේ වුව ද, විශේෂ භාණ්ඩ හා සේවා බද්ද ගණනය කිරීමේ කාර්යය සඳහා, එකී බද්ද ගෙවිය යුතු වන්නේ යම් භාණ්ඩ මත ද එම භාණ්ඩවලට අදාළ සටහන්වල බිල්පත් ශ්‍රී ලංකා රේගුව වෙත බාර දෙනු ලබන දිනය ආනයනය කිරීමේ දිනය ලෙස සැලකිය යුතු ය; හෝ

(ආ) යම් නිශ්චිතව දක්වා ඇති භාණ්ඩයක් නිෂ්පාදනය කරනු ලබන බදු අය කළ හැකි තැනැත්තකු විසින් ම, එකී නිෂ්පාදකයාගේ කර්මාන්ත ශාලාවෙන් එම නිෂ්පාදිත භාණ්ඩ ඉවත් කර ගැනීමට එක් දිනයකට පෙර විශේෂ භාණ්ඩ හා සේවා බද්ද ගෙවිය යුතු ය; හෝ

(ඇ) යම් නිශ්චිතව දක්වා ඇති සේවාවක් සපයනු ලබන බදු අය කළ හැකි තැනැත්තකු විසින් ම සෑම මාසයකම දසවන දිනයට පෙර, කලින් මාසය තුළ සපයන ලද එම සේවාව සම්බන්ධයෙන් විශේෂ භාණ්ඩ හා සේවා බද්ද ගෙවිය යුතු ය.

(3) ඉහත දක්වා ඇති පරිදි විශේෂ භාණ්ඩ හා සේවා බද්ද නොගෙවීම, එම බද්ද ගෙවීම පැහැර හරිනු ලැබූ බවට සලකනු ලැබිය යුතු ය.

නම් කරන ලද නිලධරයා විසින් ලේඛන සත්‍යායනය කිරීම

**10.** (1) 9 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට විශේෂ භාණ්ඩ හා සේවා බද්ද ගෙවීමෙන් පසු, නම් කරන ලද නිලධරයා විසින් නිශ්චිතව දැක්විය හැකි පරිදි වූ ආකෘතියෙන් සිදු කළ සෑම ගෙවීමක් සම්බන්ධ විස්තර, එම ආකෘතියේ අන්තර්ගතයන්හි නිරවද්‍යතාව සත්‍යායනය කිරීම පහසු කිරීම සඳහා, ආනයනය කරන ලද හෝ නිෂ්පාදනය කරන ලද නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ සම්බන්ධයෙන් හෝ සපයන ලද නිශ්චිතව දක්වා ඇති සේවා සම්බන්ධයෙන් අදාළ ලේඛනවල ස්කෑන් පිටපත් සමග, ඉලෙක්ට්‍රොනික ආකාරයකින් නියෝග මගින් නියම කළ හැකි පරිදි නම් කරන ලද නිලධරයාගේ විද්‍යුත් ලිපිනයට බදු අය කළ හැකි තැනැත්තා විසින් එවිය යුතු ය. නම් කරන ලද නිලධරයා විසින් එම සෑම ගෙවීමක් සහ ලේඛන ලැබුණු බවට සාධාරණ කාලයක් ඇතුළත දැනුම් දිය යුතු ය.

(2) (අ) නම් කරන ලද නිලධරයා විසින්, (1) වන උපවගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කරන ලද තොරතුරු සහ 8 වන වගන්තිය ප්‍රකාරව අන්තර්ගත වාර්තා හා ලේඛන සත්‍යායනය කිරීමෙන් පසු, මෙම පනත ප්‍රකාරව අදාළ බදු අය කළ හැකි තැනැත්තා විසින්, ගෙවිය යුතු විශේෂ භාණ්ඩ හා සේවා බද්ද නිසි පරිදි ගෙවා ඇති බවට තීරණය කිරීම සහ සහතික කිරීම කළ යුතු ය.

(ආ) සත්‍යායනය ක්‍රියාවලිය අවසන් කිරීමෙන් පසුව (1) වන උපවගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කරන ලද ආකෘතියේ හෝ එම ආකෘතියේ දක්වා ඇති තොරතුරු සඳහා සාක්ෂි වශයෙන් වන ලේඛනවල ඇතුළත් තොරතුරුවල නිරවද්‍යතාවය සම්බන්ධයෙන් නම් කරන ලද නිලධරයාට සැක කිරීමට හේතු තිබේ නම්, නම් කරන ලද නිලධරයා විසින්, විශේෂ භාණ්ඩ හා සේවා බදු ලෙස ගෙවිය යුතු නිවැරදි මුදල් ප්‍රමාණය ගෙවනු ලැබ ඇති බව ඔප්පු කිරීම සඳහා වන ලේඛන හෝ වෙනත් සාක්ෂි ඇතුළුව, වෙනත් යම් තොරතුරු සපයන ලෙසට බදු අය කළ හැකි තැනැත්තාට හෝ ඔහුගේ බලයලත් නියෝජිතවරයාට නියම කරනු ලැබිය හැකි ය.

(3) එම සත්‍යායනය ක්‍රියාවලිය සිදු කිරීමේ ක්‍රියාවලියේ දී නම් කරන ලද නිලධරයා විසින් අවස්ථාවෝචිත පරිදි, රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන්, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගෙන්, විදුලි සංදේශ අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන්, සුරා බදු අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් හෝ එවැනි වෙනත් යම් අධිකාරයකින් වැඩි දුර තොරතුරු, ලේඛන හෝ සහාය ලබා ගත හැකි අතර වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, ඔවුන්, ජාතික

ආර්ථිකයේ යහපත උදෙසා, එම සහාය ප්‍රමුඛ කාරණයක් ලෙස සලකා, නම් කරන ලද නිලධරයා වෙත නියම කරනු ලැබූ සහාය ලබා දිය යුතු ය.

(4) වැඩිදුර තොරතුරු ලැබීමෙන් පසුව හෝ කිසිදු ප්‍රතිචාරයක් නොලැබෙන අවස්ථාවක වුව ද, බදු අය කළ හැකි තැනැත්තා විසින් සපයන ලද විස්තරවල නිවැරදි බව හෝ නිරවද්‍යතාවය සම්බන්ධයෙන් නම් කරන ලද නිලධරයාට සාධාරණ සැකයක් පවතින්නේ නම්, නම් කරන ලද නිලධරයා විසින් ලිඛිතව, එම සැකය සඳහා වන හේතු පිළිබඳ බදු අය කළ හැකි තැනැත්තා වෙත දැනුම් දෙනු ලැබිය යුතු අතර, ඔහුගේ තත්ත්වය සඳහා සාක්ෂි වශයෙන් ලිඛිත ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමේ අවස්ථාවක් ඔහු වෙත ලබා දිය යුතු ය.

(5) එවැනි බදු අය කළ හැකි තැනැත්තකු විසින් ඉදිරිපත් කරන ලද ඉදිරිපත් කිරීම් තිබේ නම්, නම් කරන ලද නිලධරයා විසින්, ඒවා සලකා බැලීමෙන් පසුව, අදාළ නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ හෝ සේවා මත ගෙවිය යුතු විශේෂ භාණ්ඩ හා සේවා බද්ද තීරණය කරනු ලැබිය යුතු අතර, ඔහුගේ තීරණය අදාළ බදු අය කළ හැකි තැනැත්තා වෙත දැනුම් දිය යුතු ය. එම බදු අය කළ හැකි තැනැත්තා විසින්, සත්‍යායනය කිරීමෙන් පසු ගෙවිය යුතු විශේෂ භාණ්ඩ හා සේවා බද්ද වශයෙන් නම් කරන ලද නිලධරයා විසින් තීරණය කරන ලද මුදල සහ එම බදු අය කළ හැකි තැනැත්තා විසින් විශේෂ භාණ්ඩ හා සේවා බද්ද වශයෙන් දැනටමත් ගෙවා ඇති මුදල අතර වෙනස වන, විශේෂ භාණ්ඩ හා සේවා බදු වශයෙන් ගෙවීමට ඉතිරි යම් මුදල් ප්‍රමාණය සම්පූර්ණයෙන් ම ගෙවනු ලැබිය යුතු ය. නම් කරන ලද නිලධරයාගේ තීරණය ඇතුළත් දැන්වීම ලිඛිත විය යුතු අතර ඒ සඳහා ඔහුගේ තීරණයට අදාළ පදනම ඇතුළත් විය යුතු ය.

(6) බදු අය කළ හැකි තැනැත්තකු විසින් විශේෂ භාණ්ඩ හා සේවා බද්ද වශයෙන් ගෙවනු ලැබ ඇති මුදල් ප්‍රමාණය නම් කරන ලද නිලධරයා විසින් තීරණය කළ පරිදි බදු අය කළ හැකි තැනැත්තා විසින් ගෙවිය යුතු බදු මුදල ඉක්මවන අවස්ථාවක, නම් කරන ලද නිලධරයා විසින්, එම කරුණ පිළිබඳව බදු අය කළ හැකි තැනැත්තා දැනුවත් කළ යුතු අතර ඉක්මවා ගෙවන ලද මුදල් ප්‍රමාණය බදු අය කළ හැකි තැනැත්තා වෙත නැවත ගෙවීමට පියවර ගත යුතු ය. නැවත ගෙවීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියාවලිය සහ ආකාරය නියෝග මගින් නියමිත පරිදි විය යුතු ය.

(7) මෙම වගන්තිය ප්‍රකාරව සිදුකළ නම් කරන ලද නිලධරයාගේ තීරණයකින් අතෘප්තියට පත්වන යම් බදු අය කළ හැකි තැනැත්තකු විසින්, එම තීරණය එම බදු අය කළ හැකි තැනැත්තා වෙත ලබා දෙන ලද දින සිට දින දාහතරක් ඇතුළත, එම තීරණයට එරෙහිව අභියාචනාධිකරණය වෙත අභියාචනය කළ හැකි ය.

නම් කරන ලද නිලධරයාගේ තීරණයකින් අභියාචනය කිරීම

11. (1) අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක, නම් කරන ලද නිලධරයා විසින් 10 වන වගන්තිය ප්‍රකාරව තීරණය කරනු ලබන පරිදි වූ විශේෂ භාණ්ඩ හා සේවා බද්ද වශයෙන් ගෙවිය යුතු මුළු මුදල් ප්‍රමාණය පහත දැක්වෙන ආකාරයෙන්, අභියාචක විසින් එදිනම ගෙවනු ලැබිය යුතු ය-

(අ) ගෙවිය යුතු මුළු මුදලින් සියයට පනහක මුදලක්, මේ පනතේ 9 වන වගන්තියේ සඳහන් කරන ලද ගිණුම වෙත ගෙවනු ලැබිය යුතු ය; සහ

(ආ) ගෙවිය යුතු මුළු මුදලින් සියයට පනහක මුදලක්, බලපත්‍රලාභී යම් වාණිජ බැංකුවක් විසින් නිකුත් කරන ලද නම් කරන ලද නිලධරයාගේ නමින් නිකුත් කරන ලද ඉල්ලීමක් මත ගෙවිය යුතු බැංකු ඇපකරයක් වශයෙන්, ගෙවනු ලැබිය යුතු ය.

(2) එකී බැංකු ඇපකරය, අභියාචනාධිකරණය විසින් අභියාචනය පිළිබඳ තීරණය කරනු ලබන තෙක් වලංගු විය යුතු ය හෝ අවශ්‍ය විය හැකි පරිදි, අභියාචක විසින් වලංගු කරවිය යුතු ය.

(3) අභියාචනාධිකරණය විසින් නම් කරන ලද නිලධරයාට පක්ෂව අභියාචනය තීරණය කරනු ලබන අවස්ථාවක, එම තීරණය ගැනීමෙන් පසු ඔහු විසින්, එම අභියාචනය අභියාචනාධිකරණයේ විභාගවෙමින් පැවති මුළු කාලසීමාව ආවරණය කරන නීතිමය පොළිය සමග මුදල නැවත අය කර ගැනීම සඳහා බැංකු ඇපකරය මත හිමිකම් පෑමක් සිදු කළ යුතු ය.

(4) අභියාචනාධිකරණය විසින් අභියාචකට පක්ෂව අභියාචනය තීරණය කරනු ලබන අවස්ථාවක, නම් කරන ලද නිලධරයා විසින්, (1) වන උපවගන්තියේ (අ) ඡේදය ප්‍රකාරව ගෙවන ලද මුදල, අභියාචනය අභියාචණාධිකරණයේ විභාග වෙමින් පැවති මුළු කාලසීමාව ආවරණය කරන නීතිමය පොළිය සමග හැකි පහසු ඉක්මනින් නැවත ගෙවනු ලැබිය යුතු අතර (1) වන උපවගන්තියේ

(ආ) ඡේදය ප්‍රකාරව දෙන ලද බැංකු ඇපකරය හැකි කලින් එළැඹෙන කාලසීමාවක ආපසු භාර දෙනු ලැබිය යුතු ය.

(5) නම් කරන ලද නිලධරයාගේ තීරණයට එරෙහිව 10 වන වගන්තියේ (7) වන උපවගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව ඇතුළත කිසිදු අභියාචනයක් ගොනු කරනු නොලැබූ අවස්ථාවක, විශේෂ භාණ්ඩ හා සේවා බද්ද වශයෙන් ගෙවීමට ඉතිරිව ඇති මුදල සහ 14 වන වගන්තිය ප්‍රකාරව එම බද්ද මත පනවන ලද අදාළ දඩ මුදල, ගෙවීම පැහැර හරින ලද විශේෂ භාණ්ඩ හා සේවා බද්ද විය යුතු ය.

විශේෂ භාණ්ඩ හා සේවා බද්ද ගෙවීම පැහැර හරින අවස්ථාවක අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය

**12.** (1) යම් විශේෂ භාණ්ඩ හා සේවා බද්දක් ගෙවීම පැහැර හරිනු ලැබ ඇති අවස්ථාවක, ගෙවීම පැහැර හරින ලද විශේෂ භාණ්ඩ හා සේවා බද්ද පිළිබඳ විස්තර සහ ගෙවීම පැහැර හරින්නාගේ නම සහ ලිපිනය ඇතුළත් සහතිකයක් දිස්ත්‍රික් ලේකම්වරයකු වෙත නිකුත් කරන ලෙසට, නම් කරන ලද නිලධරයා විසින්, දේශීය අදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත නියම කරනු ලැබිය යුතු අතර එම සහතිකයේ නම් කර ඇති විශේෂ භාණ්ඩ හා සේවා බද්ද ගෙවීම පැහැර හරින්නාගේ චංචල දේපළ තහනම් කොට විකිණීම මගින් ගෙවීම පැහැර හරින ලද බදු නැවත අය කර ගනු ලැබීමට සුදුසු සහ කඩිනම් පියවර ගන්නා ලෙසට එම සහතිකය නිකුත් කරන ලද්දේ කවර දිස්ත්‍රික් ලේකම්වරයකු වෙත ද, එම දිස්ත්‍රික් ලේකම්වරයාට මෙයින් නියම කරනු ලැබේ.

(2) මේ වගන්තියේ කාර්යය සඳහා චංචල දේපළ තහනමට ගැනීම, තත් කාර්ය සඳහා වඩා යෝග්‍ය යැයි එම දිස්ත්‍රික් ලේකම්වරයා විසින් සලකනු ලබන යම් ආකාරයකින් (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහය යටතේ බලාත්මක කළ යුතු අතර එම දිස්ත්‍රික් ලේකම්වරයා විසින් යම් චංචල දේපළක් එසේ තහනමට ගැනීමෙන් පසු හැකි ඉක්මනින් ඔහු විසින් වහාම එම දේපළවල ලැයිස්තුවක් සකස් කර අත්සන් තබා එය බදු ගෙවීම පැහැර හරින්නාට දෙනු ලැබිය යුතු අතර එහි පිටපතක් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) එසේ තහනමට ගන්නා ලද දේපළ-

(අ) ශ්‍රී ලංකා රුපියල්වලින් මුදල් වන අවස්ථාවක, එම මුදල් ප්‍රථමයෙන් තහනමට ගැනීමේ පිරිවැය සහ ගාස්තු ගෙවීම සඳහා යොදාගනු ලැබිය යුතු අතර එහි යම් ඉතිරි මුදලක්

ගෙවීම පැහැර හරින ලද විශේෂ භාණ්ඩ හා සේවා බද්ද අයකර ගැනීම සඳහා යොදාගනු ලැබිය යුතු ය;

(ආ) නම් කළ විදේශ ව්‍යවහාර මුදලකින් වන මුදල් වන අවස්ථාවක, එම මුදල් යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක තැන්පත් කරනු ලැබිය යුතු අතර එයින් ලැබෙන ඉපැයුම මුදල් තහනමට ගැනීමේ පිරිවැය සහ ගාස්තු ගෙවීම සඳහා යොදා ගනු ලැබිය යුතු අතර එහි යම් ඉතිරි මුදල ගෙවීම පැහැර හරින ලද විශේෂ භාණ්ඩ හා සේවා බද්ද අයකර ගැනීම සඳහා යොදාගනු ලැබිය යුතු ය; සහ

(ඇ) මුදල් නොවන වෙනත් චංචල දේපළක් වන අවස්ථාවක, එම දේපළ, අදාළ බදු ගෙවීම පැහැර හරින්නාගේ පිරිවැය සහ ගාස්තු වශයෙන් දින හතක් තබාගනු ලැබිය යුතු ය. එම දින හත ඇතුළත බදු ගෙවීම පැහැර හරින්නා විසින් ආශ්‍රිත පිරිවැය සහ ගාස්තු සමග ගෙවීම පැහැර හරින ලද විශේෂ භාණ්ඩ හා සේවා බද්ද නොගෙවන්නේ නම්, දිස්ත්‍රික් ලේකම්වරයා විසින් එම දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබීමට හෝ එම දේපළ ගනුදෙනු කළ හැකි සාධන පත්‍රයක් හෝ යම් සංස්ථාවක හෝ පොදු සමාගමක කොටස් වන අවස්ථාවක, එම දිනයේ වෙළෙඳපොළ අනුපාතිකයට තැරැව්කරුවෙකු හරහා එම දේපළ විකුණනු ලැබීමට කටයුතු සැලැස්විය යුතු ය.

(4) (3) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් කරන ලද විකිණීමකින් ලැබෙන මුදල-

(අ) පළමුව, දේපළ තහනමට ගැනීමේ, තබා ගැනීමේ සහ විකිණීමේ පිරිවැය සහ ගාස්තු ගෙවීමට යොදාගනු ලැබිය යුතු ය; සහ

(ආ) දෙවනුව, ගෙවීම පැහැර හරින ලද විශේෂ භාණ්ඩ හා සේවා බද්ද අයකර ගැනීමට යෙදිය යුතු අතර, යම් ඉතිරියක් වේ නම් එය තහනමට ගනු ලැබූ දේපළවල හිමිකරු වෙත ගෙවනු ලැබිය යුතු ය.

(5) දේපළ තහනමට ගැනීම ක්‍රියාත්මක කරනු නොලැබීම නොතකා මේ පනත යටතේ යම් ගෙවීම පැහැර හරින්නකුට විරුද්ධව නඩු කටයුතුවල දී දැරීමට සිදු වූ සාධාරණ වියදම් දිස්ත්‍රික් ලේකම්වරයා

විසින්, එම ගෙවීම පැහැර හරින්නාගෙන් අයකර ගැනීම නීත්‍යානුකූල වන්නේ ය.

(6) (3) වන උපවගන්තියේ කාර්යය සඳහා "චංචල දේපළ" යන යෙදුමට කර්මාන්තශාලාවක පොළොවට සවිකර ඇති යම් පිරියත හෝ යන්ත්‍ර ඇතුළත් විය යුතු ය.

(7) යම් විශේෂ භාණ්ඩ හා සේවා බද්දක් ගෙවීම පැහැර හැර ඇත්තා වූ ද (1) වන උපවගන්තියේ විධිවිධාන සලසා ඇති ආකාරයට එය අයකර ගැනීම කළ නොහැකි බව හෝ යෝග්‍ය නොවන බව දේශීය අදායම් කොමසාරිස් ජනරාල්වරයාගේ මතය වන්නා වූ ද අවස්ථාවක, ගෙවීම පැහැර හරින්නා පදිංචිව සිටින හෝ ගෙවීම පැහැර හරින්නාට අයත් චංචල හෝ නිශ්චල දේපළක් පිහිටි යම් දිස්ත්‍රික්කයක් විෂයයෙහි අධිකරණ බලය ඇති දිසා අධිකරණයකට, ගෙවීම පැහැර හරින ලද විශේෂ භාණ්ඩ හා සේවා බද්දේ විස්තර ද, එම විශේෂ භාණ්ඩ හා සේවා බද්ද ගෙවිය යුත්තේ යම් ගෙවීම පැහැර හරින්නකු විසින් ද ඒ ගෙවීම පැහැර හරින්නාගේ නම සහ ලිපිනය ද ඇතුළත් සහතිකයක් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කළ හැකි ය. එවිට අධිකරණය විසින් ගෙවීම පැහැර හරින්නාගේ චංචල හෝ නිශ්චල දේපළ සියල්ලම හෝ ඉන් යමක් හෝ ගෙවීම පැහැර හරින ලද විශේෂ භාණ්ඩ හා සේවා බද්ද අය කර ගැනීම පිණිස අවශ්‍ය යැයි පිස්කල්වරයා විසින් සලකනු ලැබිය හැකි පරිදි වූ ඉන් යම් කොටසක් හෝ තහනමට ගෙන විකිණීමට බලය දෙන හා නියම කරන ක්‍රියාවේ යෙදවීමේ රිට් ආඥාවක් පිස්කල් වෙත නිකුත් කිරීමට විධාන කළ යුතු ය. (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහය 226 වන වගන්තියේ සිට 297 වන වගන්තිය දක්වා වන වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ තහනමට ගැනීමට හා විකිණීමට අදාළ විය යුතු ය.

(8) දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් මෙම වගන්තිය යටතේ සහතිකයක් නිකුත් කරනු ලබන අවස්ථාවක, ඔහු විසින් ඒ සම්බන්ධ නිවේදනයක්, නේවාසික වුව ද, අනේවාසික වුව ද, ගෙවීම පැහැර හරින්නා වෙත ලියාපදිංචි තැපෑලෙන් එම අවස්ථාවේ දී ම නිකුත් කරනු ලැබිය යුතු ය. එම නිවේදනය, ගෙවීම පැහැර හරින්නා වෙත නොලැබීම මේ වගන්තිය යටතේ වන නඩු කටයුතු අවලංගු කිරීමක් නොකරනු ලැබිය යුතු ය.

තහනමට ගැනීම හෝ විකිණීම ප්‍රායෝගික නොවන අවස්ථාවක දී ගෙවීම පැහැර හරින ලද විශේෂ භාණ්ඩ හා සේවා බද්ද අයකර ගැනීම

13. (1) (අ) ගෙවීම පැහැර හරින ලද විශේෂ භාණ්ඩ හා සේවා බද්ද, තහනම් කොට විකිණීමෙන් අය කර ගැනීම කළ නොහැකි බව හෝ යෝග්‍ය නොවන බව හෝ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගේ මතය වන අවස්ථාවක නැතහොත් තහනම් කොට විකිණීමෙන් සම්පූර්ණ විශේෂ භාණ්ඩ හා සේවා බද්ද මුදල අය කර ගනු නොලැබූ අවස්ථාවක, ගෙවීම පැහැර හරින ලද ඒ විශේෂ භාණ්ඩ හා සේවා බද්ද මුදලේ විස්තර ද ගෙවීම පැහැර හරින්නාගේ නම සහ අන්තිමට දැන සිටි ව්‍යාපාරික ස්ථානය හෝ පදිංචි ස්ථානය ද දැක්වෙන සහතිකයක්, ඒ ගෙවීම පැහැර හරින්නා පදිංචිව සිටින හෝ ව්‍යාපාර කරගෙන යනු ලබන ස්ථානය පිහිටි කොට්ඨාසය විෂයෙහි අධිකරණය බලය ඇති මහෙස්ත්‍රාත්වරයා වෙත දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කළ හැකි ය.

(ආ) මහෙස්ත්‍රාත්වරයා විසින්, (1) වන උපවගන්තිය යටතේ නිකුත් කළ සහතිකය ලැබීමෙන් පසුව, එම ගෙවීම පැහැර හරින්නාට එරෙහිව ගෙවීම පැහැර හරින ලද බද්ද අයකර ගැනීම සඳහා වැඩිදුර නඩු කටයුතු පැවැත්වීම යුක්ති සහගත නොවන්නේ මන්ද යන්නට කරුණු දැක්වීම සඳහා නිශ්චිතව දක්වන ලද දිනයක දී, මහෙස්ත්‍රාත්වරයා හමුවේ පෙනී සිටීම සඳහා ගෙවීම පැහැර හරින්නාට නියම කරමින් ඔහු වෙත සිතාසි නිකුත් කරනු ලැබිය යුතු අතර, ප්‍රමාණවත් හේතු නොපෙන්වුවහොත්, ගෙවීම පැහැර හරින ලද විශේෂ භාණ්ඩ හා සේවා බද්ද, දඩයකින් පමණක් දඬුවම් කළ හැකි වරදක් සඳහා හෝ බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් නොකළ යුතු වරදක් සඳහා, එකී ගෙවීම පැහැර හරින්නා මත ඒ මහෙස්ත්‍රාත්වරයාගේ දණ්ඩන නියමයකින් නියමිත දඩයක් ලෙස සැලකිය යුතු අතර එවිට එවැනි වරදක් සඳහා නියම කරන ලද දඩයක් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන (එහි (අ), (ඈ) සහ (එ) ඡේදවල විධිවිධාන හැර) එතැන් සිට අදාළ විය යුතු අතර මහෙස්ත්‍රාත්වරයා විසින්, එම උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව එකී දඬුවම නියම කරන අවස්ථාවේ දී ඔහුට කළ හැකි යම් විධානයක් කරනු ලැබිය හැකි ය.

(2) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සිට (5) වන උපවගන්තිය දක්වා වන උපවගන්තිවල කිසිවක් (1) වන උපවගන්තියේ සඳහන් යම් අවස්ථාවක දී අදාළ නොවිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් වූ ගෙවීම පැහැර හරින්නා මත නියම කරන ලදැයි ඒ උපවගන්තියෙන් සැලකෙන දඩය ගෙවීම පැහැර හැරීම මත ගෙවීම පැහැර හරින්නා බන්ධනාගාරගත කිරීමකට නියම කරනු ලැබුවා වූ එම උපවගන්තියේ සඳහන් යම් අවස්ථාවක, ඒ දඩ මුදල ගෙවීම සඳහා මාස දොළහක් නොඉක්මවන කාලයක් සඳහා මහෙස්ත්‍රාත්වරයා විසින් කල්දිය හැකි ය. නැතහොත් ඒ මුදල වාරික මගින් ගෙවන ලෙස විධාන කළ හැකි ය. එසේ වුව ද, මාස දොළහක් නොඉක්මවන කාලසීමාවක් තුළ ගෙවනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති පරිදි හේතු දැක්වීම සඳහා ඒ උපවගන්තිය යටතේ කල් දීමෙහි හෝ (3) වන උපවගන්තිය යටතේ දඩය ගෙවීම සඳහා කල් දීමෙහි වූ මූලික කොන්දේසියක් වශයෙන්, අධිකරණය විසින් ඇප නියම කළ හැකි ය; තව ද ගෙවීම පැහැර හරින්නාට එලෙස ඇප ලබා දීමට නියම කළ විටක 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ XXXIV වන පරිච්ඡේදයේ විධිවිධාන අදාළ විය යුතු ය.

(5) (3) වන උපවගන්තිය යටතේ වාරික මගින් ගෙවීමට නියම කරනු ලැබ තිබිය දී, ඉන් යම් වාරිකයක් ගෙවීම පැහැර හරිනු ලබන අවස්ථාවක ඒ වන විට නොගෙවා ඉතිරි වී ඇති සියලු වාරික ගෙවීම පැහැර හැර ඇත්තාක් සේ නඩු පැවරිය හැකි ය.

(6) (1) වන උපවගන්තිය යටතේ වන යම් නඩු කටයුත්තක දී, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගේ සහතිකය විශේෂ භාණ්ඩ හා සේවා බද්ද ගෙවීම පැහැර හරින ලද බවට ප්‍රමාණවත් සාක්ෂියක් විය යුතු අතර, විශේෂ භාණ්ඩ හා සේවා බද්ද අධිකවන බවට, වැරදි සහගත බවට හෝ අභියාචනය යටතේ වන බවට වන යම් ආයාචනයක් භාර නොගත යුතු ය.

**ප්‍රමාද ගෙවීම් සඳහා දඩ**

**14.** 9 වන වගන්තියේ (2) වන උපවගන්තියේ දක්වා ඇති දිනයේ දී හෝ 10 වන වගන්තියේ (5) වන උපවගන්තියේ දක්වා ඇති දැන්වීමෙහි නිශ්චිතව දැක්විය හැකි පරිදි වූ ගෙවිය යුතු දිනයේ දී හෝ ඊට පෙර දිනයක දී මෙම පනත යටතේ නියමිත විශේෂ භාණ්ඩ හා සේවා බද්ද සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක් ගෙවනු නොලබන බදු අයකළ හැකි තැනැත්තකු, ගෙවීමට නියමිත සම්පූර්ණ බදු මුදලින් සියයට දහයක ප්‍රතිශතයකට සමාන දඩයකට යටත්විය යුතු ය.

නිල රහස්‍යභාවය

**15.** (1) (3) වන, (4) වන හෝ (5) වන උපවගන්තිවල විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, මේ පනත යටතේ කාර්යයක් ඉටු කරන හෝ මේ පනතේ පරිපාලනයෙහි නියුක්ත කර ඇති සෑම තැනැත්තකු ම විසින් බදු අයකළ හැකි තැනැත්තකුට අදාළව රාජකාරී මට්ටමෙන් එම තැනැත්තා වෙත ලැබෙන සියලු තොරතුරු සහ ලේඛන, රහස්‍ය සහ විශ්වාස්‍ය තොරතුරු සහ ලේඛන වශයෙන් සලකනු ලැබිය යුතු අතර පහත දැක්වෙන තැනැත්තන්ට පමණක් එම තොරතුරු අනාවරණය කරනු ලැබිය හැකි යඃ-

(අ) මේ පනතේ විධිවිධාන සලසා ඇති පරිදි තම කාර්යය සිදු කරගෙන යනු ලබන සේවා නියුක්තයන් වෙත;

(ආ) රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා, සුරා බදු අධ්‍යක්ෂ ජනරාල්වරයා, විදුලි සංදේශ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ වෙනත් අදාළ අධිකාරයක ප්‍රධානියකු අධීක්ෂණය කරගෙන යාමේ ක්‍රියාවලියක දී සහ එකී අධීක්ෂණය සිදුකරගෙන යාමේ කාර්යය සඳහා අමාත්‍යවරයා වෙත;

(ඇ) රාජකාරී කටයුතු කිරීමේ කාර්යය සඳහා එම අනාවරණය කිරීම අවශ්‍ය වීම මත පමණක් විගණකාධිපතිවරයා හෝ විගණකාධිපතිවරයා විසින් බලය පවරන ලද යම් තැනැත්තකු වෙත;

(ඈ) යම් නිශ්චිත අධිකාරියක් සමග ඇතුළත් වූ ජාත්‍යන්තර ගිවිසුමකට අනුකූලව විදේශ රටක බදු අධිකාරීන් වෙත;

(ඉ) රජය විසින් හෝ රජයට එරෙහිව පවරනු ලබන අපරාධ නඩු කටයුතුවල හෝ සිවිල් නඩු කටයුතුවල කාර්යය සඳහා හෝ බලයලත් ආයතනය විසින් ලිඛිතව නීතිපතිවරයාගේ මතය හෝ උපදෙස් ඉල්ලා ඇති අවස්ථාවක නීතිපතිවරයා වෙත;

(ඊ) වරදක් සඳහා බදු අයකළ හැකි තැනැත්තාගේ බැඳීම හෝ වගකීම ස්ථාපනය කිරීම සඳහා වන නඩු කටයුත්තක දී අධිකරණය වෙත;

(උ) 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ වූ උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් නඩු පැවරීමේ කාර්යය සඳහා විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වෙත;

(ඌ) යම් තැනැත්තකුගේ හෝ යම් තැනැත්තකුගේ කලත්‍රයාගේ හෝ දරුවකුගේ කටයුතු පිළිබඳ විමර්ශනයක දී (393 වන අධිකාරය වූ) පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත්කරන ලද කොමිෂන් සභාව වෙත; සහ

(එ) 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත යටතේ පිහිටුවන ලද අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත.

(2) (1) වන උපවගන්තිය යටතේ තොරතුරු අනාවරණය කිරීම සඳහා අවසරය ලැබූ තැනැත්තකු විසින්, එම අනාවරණය සඳහා අවසර ලබා දුන් අරමුණ ඉටුකර ගැනීමට අවශ්‍ය වන අවම ප්‍රමාණයට හැර, රහස්‍යභාවය පවත්වාගනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ තොරතුරු ලද යම් තැනැත්තකු විසින්, එම තොරතුරු ලැබුණු අරමුණ ඉටුකර ගැනීමට අවශ්‍ය වන අවම ප්‍රමාණය හැර, රහස්‍යභාවය පවත්වාගනු ලැබිය යුතු ය.

(4) එකී හිමිකම් පෑමේ සත්‍යතාවය පිළිබඳ යුක්ති සහගත සහතිකයක් ලබා ගැනීමෙන් පසුව පමණක් නම් කරන ලද නිලධරයා විසින් බදු අයකළ හැකි තැනැත්තා සම්බන්ධයෙන් වන තොරතුරු, එම බදු අයකළ හැකි තැනැත්තා වෙත හෝ බදු අයකළ හැකි තැනැත්තාගේ බලයලත් නියෝජිතයා වෙත අනාවරණය කරනු ලැබිය හැකි ය.

(5) බදු අයකළ හැකි තැනැත්තා සම්බන්ධයෙන් වන තොරතුරු බදු අයකළ හැකි තැනැත්තාගේ ලිඛිත අනුමතය ඇතිව වෙනත් තැනැත්තකු වෙත අනාවරණය කරනු ලැබිය හැකි ය.

(6) මෙම වගන්තිය මගින් පනවන ලද රහස්‍යභාවය පිළිබඳ බැඳීම, යම් තැනැත්තකු මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා පත් කරනු ලැබීම හෝ සේවා නියුක්ත කිරීම අවසන් වීම නොතකා, එම තැනැත්තා සම්බන්ධයෙන් අඛණ්ඩව අදාළ විය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයක සාමාජිකයකු හෝ සංස්ථාපිත මණ්ඩලයේ හවුල්කරුවකු සතු වගකීම

**16.** යම් විශේෂ භාණ්ඩ හා සේවා බදු මුදලක් ගෙවීම පැහැර හරිනු ලබන අවස්ථාවකː-

(අ) ගෙවීම පැහැර හරින්නා සංස්ථාපිත මණ්ඩලයක් වන අවස්ථාවක, විශේෂ භාණ්ඩ හා සේවා බද්ද ගෙවීම පැහැර හරින ලද අවස්ථාවේ දී එම සංස්ථාපිත මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු, ලේකම්වරයකු හෝ සමාන නිලධරයකුව සිටි සෑම තැනැත්තකුම; හෝ

(ආ) ගෙවීම පැහැර හරින්නා සංස්ථාපිත මණ්ඩලයක් නොවන මණ්ඩලයක් වන අවස්ථාවක, විශේෂ භාණ්ඩ හා සේවා බද්ද ගෙවීම පැහැර හරින ලද අවස්ථාවේ දී එම මණ්ඩලයේ සාමාජිකයකු හෝ හවුල්කරුවකුව සිටි සෑම තැනැත්තකුම,

එම තැනැත්තාගේ දැනීමෙන් තොරව එම විශේෂ භාණ්ඩ හා සේවා බද්ද ගෙවීම පැහැර හරින ලද බවට හෝ ගෙවීමට නියමිතව පැවති විශේෂ භාණ්ඩ හා සේවා බද්ද ගෙවීමට නිසි උද්යෝගයෙන් යුතුව ක්‍රියා කළ බවට ඔහු විසින් ඔප්පු කරනු ලබන්නේ නම් මිස, පෞද්ගලිකව වගකිව යුතු වන බවට සලකනු ලැබිය යුතු ය.

ඒකාබද්ධ අරමුදලෙන් ගෙවනු ලැබිය යුතු වියදම්

**17.** (1) යම් අධිකරණයක් ඉදිරියේ නම් කරන ලද නිලධරයා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධරයකු විසින් හෝ නම් කරන ලද නිලධරයාට හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධරයාට එරෙහිව පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී, නම් කරන ලද නිලධරයා හෝ ඔහු විසින් බලය පවරන ලද යම් නිලධරයකු විසින් දරනු ලබන සියලු වියදම් ඒකාබද්ධ අරමුදලෙන් ගෙවනු ලැබිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී නම් කරන ලද නිලධරයා හෝ ඔහු විසින් බලය පවරන නිලධරයා විසින් ගෙවන ලද හෝ අයකර ගන්නා ලද වියදම් පමණක් ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(2) නම් කරන ලද නිලධරයා හෝ ඔහු විසින් බලය පවරන ලද යම් නිලධරයකු විසින් මේ පනත යටතේ සිදු කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් එම නිලධරයා විසින් හෝ එම නිලධරයාට එරෙහිව යම් අධිකරණයක් ඉදිරියේ පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී එම නිලධරයා විසින් දරනු ලබන වියදම්, එම ක්‍රියාව සද්භාවයෙන් කරන ලද බව අධිකරණය විසින් තීරණය කරනු ලැබුවහොත්, එම සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී එම වියදම ඔහු විසින් ආපසු අය කර

ගනු ලැබ ඇත්නම් මිස එම වියදම් ඒකාබද්ධ අරමුදලෙන් ගෙවනු ලැබිය යුතු ය.

අන්තර්කාලීන විධිවිධාන

**18.** 2 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ සාදන ලද නියමය ක්‍රියාත්මක වන දිනට පෙර මෙහි උපලේඛනයේ දක්වා ඇති යම් ප්‍රඥප්තියක් ප්‍රකාරව යම් නිශ්චිතව දක්වා ඇති විශේෂ භාණ්ඩ හා සේවා සඳහා යම් බද්දක්, තීරු බද්දක්, අය බද්දක්, සෙස් බද්දක් හෝ වෙනත් යම් ගාස්තුවක් පනවනු ලැබ ඇති අවස්ථාවක, 2 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ පැනවූ නියමය නොතකා, පනවනු ලැබ ඇති එම බද්ද, තීරු බද්ද, අය බද්ද, සෙස් බද්ද හෝ වෙනත් යම් ගාස්තු එම ප්‍රඥප්ති ප්‍රකාරව දිගටම අයකර ගත යුතු ය.

නියෝග

**19.** (1) නියම කරනු ලැබිය යුතු යැයි මේ පනතින් නියමිත හෝ මේ පනත යටතේ නියෝග සෑදීමට නියමිත හෝ නියෝග සෑදීමට බලය දී ඇති සියලු කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතලවල ව්‍යාප්තියට අගතියක් නොවන පරිදි, පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි යː-

(අ) නම් කරන ලද නිලධරයාගේ විද්‍යුත් ලිපිනය;

(ආ) මේ පනත යටතේ විශේෂ භාණ්ඩ හා සේවා බදු ගෙවීමේ වගකීමට යටත් වන යම් ආනයනකරුවකු, නිෂ්පාදකවරයකු හෝ සේවා සපයන්නකු ලියාපදිංචි කිරීම සඳහා වන ආකෘතිය, ගාස්තු සහ අනුගමන කළ යුතු ක්‍රියා පටිපාටිය;

(ඇ) බදු අය කළ හැකි තැනැත්තා වෙත නිකුත් කළ යුතු ලියාපදිංචි කිරීමේ සහතිකයේ ආකෘතිය;

(ඈ) සුදුසුකම්ලත් විගණකවරයකු විසින් 8 වන වගන්තියේ කාර්යය සඳහා නිකුත් කළ යුතු ලියාපදිංචි කිරීමේ සහතිකයේ ආකෘතිය;

(ඉ) 8 වන වගන්තියේ කාර්යය සඳහා වන ලේඛනවල අන්තර්ගතවිය යුතු විස්තර;

(ඊ) ගෙවීමට නියමිතව තිබූ සත්‍ය මුදල් ප්‍රමාණය ඉක්මවා බදු අය කළ හැකි තැනැත්තකු විසින් විශේෂ භාණ්ඩ හා සේවා බදු වශයෙන් අතිරික්තව ගෙවන ලද යම් මුදල් ප්‍රමාණයක් ආපසු ලබා ගැනීම සඳහා වන ඉල්ලීමක් කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය සහ ආකාරය;

(උ) යම් බදු අය කළ හැකි තැනැත්තකු විසින් ආනයනය කරන ලද හෝ නිෂ්පාදනය කරන ලද යම් විශේෂ භාණ්ඩයක් හෝ සපයන ලද යම් විශේෂ සේවාවක් පිළිබඳව තොරතුරු ලබා දීමේ කාර්යය සඳහා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා, විදුලි සංදේශ අධ්‍යක්ෂ ජනරාල්වරයා, සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා හෝ වෙනත් යම් අදාළ ආයතනයක ප්‍රධානියකු විසින් අනුගමනය කරනු ලැබිය යුතු ක්‍රියාපටිපාටිය නියම කරමින්; සහ

(ඌ) නියම කරනු ලැබිය යුතු යයි මේ පනතින් නියමිත හෝ මේ පනත යටතේ නියෝග සෑදීමට බලය දී ඇති යම් කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලසීම.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එම පළ කරන ලද දිනයේ දී හෝ එම නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පරිදි යම් පසු දිනයක දී ක්‍රියාත්මකභාවයට එළැඹිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක්ම එසේ ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු මාස තුනකට වඩා පසු නොවන කාලයක් තුළ පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත නොකරන ලද සෑම නියෝගයක් ම, ඒ යටතේ කලින් සිදු කරන ලද කිසිවකට අගතියක් නොමැතිව, ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) ඒ අනනුමතයේ දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය.

**20.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි- අර්ථ නිරූපනය

"බලයලත් නියෝජිතයා" යන්නෙන්,-

(අ) මේ පනතේ කාර්යය සඳහා බදු අයකළ හැකි තැනැත්තා වෙනුවෙන් කටයුතු කිරීම සඳහා එම තැනැත්තා විසින් ලිඛිතව බලය ලබාදෙන ලද (i) වන, (ii) වන සහ (iii) වන අයිතමයන්හි නිශ්චිතව දක්වා ඇති යම් පුද්ගලයකු,

(i) 1959 අංක 23 දරන වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ සාමාජිකයකු;

(ii) නීතිඥවරයකු; හෝ

(iii) එම තැනැත්තා විසින් නිත්‍ය ලෙස සේවයෙහි නියුක්ත කරනු ලැබූ සේවා නියුක්තකයකු;

(ආ) බදු අයකළ හැකි තැනැත්තා තනි පුද්ගලයකු වන අවස්ථාවක දී, මේ පනතේ කාර්යය සඳහා බදු අයකළ හැකි තැනැත්තා වෙනුවෙන් කටයුතු කිරීම සඳහා එම තැනැත්තා විසින් ලිඛිතව බලය දෙනු ලබන ඥාතියකු;

(ඇ) බදු අය කළ හැකි තැනැත්තා ශ්‍රී ලංකාව තුළ හෝ පිටත සංස්ථාපිත සමාගමක් වන අවස්ථාවක දී, එම සමාගමේ අධ්‍යක්ෂවරයා, ලේකම්වරයා හෝ ප්‍රධාන නිලධරයා;

(ඈ) බදු අයකළ හැකි තැනැත්තා හවුල් ව්‍යාපාරයක් වන අවස්ථාවක දී, හවුල්කරුවකු;

(ඉ) බදු අයකළ හැකි තැනැත්තා භාරයක් වන අවස්ථාවක දී, භාරකරුවකු;

(ඊ) බදු අය කළ හැකි තැනැත්තා හවුල් ව්‍යාපාරයක් හෝ සමාගමක් නොවන පුද්ගල මණ්ඩලයක් වන අවස්ථාවක දී, පුද්ගල මණ්ඩලය වෙනුවෙන් අරමුදල්වල මුදල් ලැබීම සහ ගෙවීම සඳහා ගිණුම් තැබීම සම්බන්ධව වගකිවයුතු තනි පුද්ගලයකු; හෝ

(උ) බදු අය කළ හැකි තැනැත්තා අනේවාසික වන අවස්ථාවක දී, ශ්‍රී ලංකාවේ එම තැනැත්තාගේ ව්‍යාපාරයක කළමනාකරුවකු ඇතුළුව ශ්‍රී ලංකාවේ තැනැත්තාගේ කටයුතු පාලනය කරනු ලබන තැනැත්තකු,

අදහස් වේ;

"සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා" යන්නෙන්, (52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 7 වන වගන්තියේ විධිවිධාන යටතේ පත් කරන ලද සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා අදහස් වේ;

"දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා" යන්නෙන්, 2017 අංක 24 දරන දේශීය ආදායම් බදු පනතේ 97 වන වගන්තියේ විධිවිධාන යටතේ පත්කරන ලද දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා අදහස් වේ;

"රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන්නෙන්, (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනතේ 2 වන වගන්තියේ විධිවිධාන යටතේ පත් කරන ලද රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ;

"විදුලි සංදේශ අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන්නෙන්, 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 22ආ වන වගන්තියේ විධිවිධාන යටතේ පත්කරනු ලබන විදුලි සංදේශ අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ;

"බලපත්‍රලාභී වාණිජ බැංකු" යන්නෙන්, 1988 අංක 30 දරන බැංකු පනතේ විධිවිධාන යටතේ බලපත්‍රලාභී බැංකුවක් අදහස් වේ;

"මත්පැන්" යන්නෙන්, වයින් ස්ප්‍රීතු, ස්ප්‍රීතු, මුද්‍රික පානය, රා, බීර සහ මද්‍යසාර අඩංගු හෝ අන්තර්ගත සියලුම ද්‍රව වර්ගයන්; තවද, මෙම පනතේ කාර්යයන් සඳහා අමාත්‍යවරයා විසින් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කරනු ලබන යම් ද්‍රවයක් ඇතුළත් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන හෝ 45 වන ව්‍යවස්ථා යටතේ මේ පනත පවරනු ලබන්නේ යම් අමාත්‍යවරයකුට ද, එම අමාත්‍යවරයා අදහස් වේ;

"සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන්-

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ආ) යම් ගණකාධිකාරී ආයතනයක, එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද, එමෙන්ම ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද, එවැනි වරලත් ගණකාධිකාරී ආයතනයක්,

අදහස් වේ;

"කාර්තුව" යන්නෙන්, සෑම වසරකම ජනවාරි මස පළමු දිනයෙන්, අප්‍රේල් මස පළමු දිනයෙන්, ජූලි මස පළමු දිනයෙන්, සහ ඔක්තෝබර් මස පළමු දිනයෙන් ආරම්භවන මාස තුනක කාලය අදහස් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**21.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

උපලේඛනය

(2, 3, 4, 8 සහ 18 වන වගන්ති)

| | I වන තීරය<br>ප්‍රඥප්තියේ නම | II වන තීරය<br>අදාළ බද්ද |
|---|---|---|
| 1. | (52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනත | සුරා බද්ද |
| 2. | 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත | නිෂ්පාදන බද්ද |
| 3. | 2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනත | විදුලි සංදේශ බද්ද |
| 4. | 2018 අංක 35 දරන මුදල් පනත | (i) දුරකථන සන්නිවේදන කුළුණු අය බද්ද<br>(ii) මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද<br>(iii) ජංගම දුරකථන කෙටි පණිවුඩ සේවා මත අය බද්ද<br>(iv) වාහන හිමිකම් අය බද්ද |
| 5. | 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනත | මුළු එකතු කිරීම් මත බද්ද |
| 6. | (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත | තීරු බද්ද |
| 7. | 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත | සෙස් බද්ද |
| 8. | 2011 අංක 18 දරන වරාය සහ ගුවන්තොටුපොළ සංවර්ධන බදු පනත | වරාය සහ ගුවන්තොටුපොළ සංවර්ධන බද්ද |